පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# දෙවන වාර පරීක්ෂණය - 2017

විෂයය - දේශපාලන විද්‍යාව I

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................
..........................................................................................................

කාලය : පැය 02 යි.

**සැලකිය යුතුයි :**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 15 දක්වා ප්‍රශ්න වලට වැරදි ප්‍රකාශය තෝරන්න.**

1) දේශපාලන විද්‍යාව ,
   i. සමාජ විද්‍යාවක් ලෙස සැලකේ.
   ii. ජීව විද්‍යාව සමග සමීපව සම්බන්ධ වේ.
   iii. අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ ග්‍රීක යුගයෙනි.
   iv. නිශ්චිත නිර්වචන හා එකඟතා දැකිය නොහැක.
   v. මිනිසාගේ දේශපාලන චර්යාවන් අධ්‍යයනයට ලක්කරයි.

2) දේශපාලනය ,
   i. මිනිසාගේ ප්‍රායෝගික දේශපාලන ක්‍රීඩාවයි.
   ii. ජාතික හා ජාත්‍යන්තර ලෙස වර්ග කළ හැක.
   iii. විධිමත් ක්‍රමයෙන් පමණක් අධ්‍යයනය කළ හැක.
   iv. ප්‍රජාතන්ත්‍රවාදී රටවල දේශපාලන පක්ෂ මගින් ඉස්මතු වේ.
   v. අන්තර්ජාතික සමාජය තුළ ක්‍රියාත්මක වන්නේ යුද්ධය මගිනි.

3) දේශපාලන විද්‍යාව විෂය අධ්‍යයනයේ දී ,
   i. මිනිසා සහ සංවිධිත දේශපාලන සමාජයක ගොඩනගා ඇති දේශපාලන ආයතනවල ස්වාභාවය විමසයි.
   ii. මිනිසා සංවිධිත දේශපාලන සමාජයක හැසිරෙන ආකාරය විමසයි.
   iii. මිනිසා දේශපාලන අරමුණු ඉටුකර ගන්නේ කෙසේ ද යන්න විමසයි.
   iv. මිනිසාට භෞතික හා අධ්‍යාත්මික වර්ධනය ලබා දෙන්නේ කෙසේ ද විමසයි.
   v. මිනිසා දේශපාලන වශයෙන් සමාජානුයෝජනය වන්නේ කෙසේදැයි විමසයි.

4) ඓතිහාසික අධ්‍යයන ක්‍රමය මගින් ,
   i. අගය කිරීම බහුල වේ.
   ii. විස්තර කිරීම් බහුල වේ.
   iii. පෞද්ගලිකත්වයන් ඉස්මතු වේ.
   iv. අතීත හා වර්තමානයන් සැසඳේ.
   v. වීරයන් හා ආගම් ප්‍රචලිත වේ.

Education NCP - www.edncp.lk

5) රාජ්‍ය ,

i. වාර්ගිකත්වය මත පමණක් පදනම් ව ඇත.

ii. ජාතියේ සාමූහික කැමැත්තේ ඒජන්තවරයා ය.

iii. උත්තරීතර බලයේ තනි හා අසහාය හිමිකරු ය.

iv. 17 වන සියවසේ ජාතික රාජ්‍යයවශයෙන් සංවිධානය වූ ආකාරයක් දැකිය හැකි ය.

v. දේශපාලන , ආර්ථික වශයෙන් වෙනස්වෙමින් ඉදිරියට ගමන් කරයි.

6) ජාතික රාජ්‍යයක නෛතික පදනම වනුයේ ,

i. රාජ්‍යයක අභ්‍යන්තර කටයුතු වලට වෙනත් රාජ්‍යයක් මැදිහත් නොවිය යුතු ය.

ii. ස්වාධිපති රාජ්‍යයන් නිළ සම්බන්ධතා පැවැත්විය යුත්තේ විදේශ ඇමතිය මගිනි.

iii. සෑම රාජ්‍යයකට සමාන ස්වාධිපති බලයක් ඇත.

iv. පිළිගත් දේශසීමාව තුළ රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධ ස්වාධිපති බලය භුක්ති විඳී.

v. එවැනි ස්වාධිපති රාජ්‍යයන්ගෙන් අන්තර්ජාතික සමාජය සමන්විත වේ.

7). ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ සාධක වූයේ ,

i. භූමිය විශාල වීම.

ii. ජාතික ඒකාග්‍රතාවය.

iii. යුධ හා නාවික ශක්තිය.

iv. දියුණු ආර්ථිකයක් පැවතීම.

v. ජාතීන්ගේ නිර්මාණශීලි හැකියාව.

8) සුභ සාධක රාජ්‍ය තුළ ,

i. සමාන පුරවැසියන් හා සමාන ඉඩප්‍රස්තා යන සිද්ධාන්තය පදනම් කරගත්තේ ය.

ii. ආර්ථික හා සමාජ කටයුතු කළමණාකරණයට රාජ්‍ය මැදිහත් විය.

iii. මිල්ටන් ෆ්‍රීඩ්මාන්ගේ ආර්ථික දර්ශනය න්‍යායික පසුබිම සැකසී ය.

iv. ලෝක යුද්ධවලින් වූ හානිය ප්‍රතිසංස්කරණයට රජය මැදිහත් වීම.

v. පෞද්ගලික අංශය මැදිහත් නොවන ක්ෂේත්‍ර වලට රාජ්‍ය මැදිහත් වීම.

9) රාජ්‍ය සම්භවය පිළිබඳව සමාජ විකාශනාත්මක න්‍යායට අනුව ,

i. රාජ්‍ය විකාශනයේ ආරම්භය පවුලයි.

ii. දීර්ඝ සමාජ විකාශනයක ප්‍රතිඵලයකි.

iii. රාජ්‍ය නිර්මාණයට ආගම පිටුවහලක් වී ඇත.

iv. මිනිසුන් අතර සමාජ සම්මුතියක් ඇති කරගත් බැවින් ආරම්භ විය.

v. මිනිස් සංහතිය පවතින තෙක් රාජ්‍යය ද පවතී.

10) සමාජවාදී රාජ්‍යය ,

i. තරගකාරී බහුපක්ෂ ක්‍රමය සහිත දේශපාලනය ක්‍රමයකි.

ii. පෞද්ගලික යහපතට වඩා සාමූහික යහපත අගයකරයි.

iii. ආර්ථිකය රාජ්‍යයේ දැඩි පාලනයට හසුවී ඇත.

iv. නිෂ්පාදන උපක්‍රම පිළිබඳ පොදු අයිතිය දැකිය හැකි ය.

v. කොමියුනිස්ට් මූලධර්ම මත සමාජය ගොඩනැගී ඇත.

Education NCP - www.edncp.lk

11) ෆැසිස්ට් වාදයට අනුව ,

i. රාජ්‍යයට අවනත වීමෙන් පුද්ගල නිදහස සුරකේ.

ii. රාජ්‍ය හා පුද්ගලයා කාර්යක්ෂම වන්නේ යුද්ධය මගිනි.

iii. සමාජය අර්ථවත් වන්නේ නායකයාට අවනත වීමෙනි.

iv. රාජ්‍යයේ නියෝගවලට ප්‍රශ්න කිරීමෙන් තොරව ජනතාව එකඟ විය යුතු ය.

v. රාජ්‍ය ජනතාව සඳහා මිස ජනතාව රාජ්‍ය සඳහා නොවේ.

12) ආණ්ඩුව ,

i. එයට හිමිවන්නේ රාජ්‍ය මගින් අවධාරිත කරන ලද බලයකි.

ii. එහි සාමාජිකත්වය අනිවාර්යය නොවන්නේ ය.

iii. රාජ්‍යයේ නියෝජිතයා වන්නේ ය.

iv. රාජ්‍ය පාලනය කරන්නා වූ පුද්ගල කණ්ඩායමකි.

v. සමස්ත දේශපාලන සමාජය නියෝජනය කරයි.

13) ආණ්ඩුව තම බලය ජනතාව මත පටවන්නේ ,

i. සහයෝගය මගිනි.

ii. බලකිරීම මගිනි.

iii. දඬුවම් කිරීම මගිනි.

iv. වාරණ මගිනි.

v. අල්ලස මගිනි.

14) ස්වාධිපත්‍ය ,

i. අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කළ හැකි ය.

ii. විධායකය තනිව මෙම බලය භුක්ති විඳියි.

iii. රාජ්‍යයට ජීවය සපයයි.

iv. අසහාය හා අසීමිත බලය මේ නමින් හැඳින්වේ.

v. රාජ්‍යයේ සෙසු සමාගම් වලට හිමි නොවේ.

15) බලතල බෙදීමේ න්‍යාය ,

i. A.V. ඩයිසි විසින් ඉදිරිපත් කළ න්‍යායකි.

ii. ඇමරිකානු ව්‍යවස්ථා සම්පාදකයින් යොදාගත් න්‍යායකි.

iii. බලතල බෙදීමෙන් ආණ්ඩුව කාර්යක්ෂම වේ.

iv. ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ බලය එකිනෙක වෙන්කර තිබිය යුතු ය.

v. එක් අයෙකු මත පවතීනම් ඔහු ඒකාධිපතියෙකු වේ.

Education NCP - www.edncp.lk

▪ **අංක 16 සිට 25 දක්වා ප්‍රකාශ හතරක් නිවැරදිය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

16) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ,

A. මූලික නීතිය ලෙස සැලකේ.

B. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික අංගයකි.

C. ආණ්ඩුවේ ක්‍රියාමාර්ග පාලනය කරයි.

D. සමාජ අවශ්‍යතා අනුව වෙනස් නොවිය යුතුයි.

E. ලිඛිත හා අලිඛිත ව්‍යවස්ථා විය හැකි ය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

17) සංධීය ආණ්ඩුක්‍රමයක ,

A. ලැයිස්තු තුනක් යටතේ බලතල බෙදා ඇත.

B. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම බලය බෙදා ඇත.

C. බ්‍රිතාන්‍ය සාර්ථක සංධීය රාජ්‍යයකි.

D. ස්වාධීන අධිකරණය ගැටළු විසඳීමට මැදිහත් වේ.

E. මධ්‍යම බල අධිකාරියට අමතර ව තවත් බල අධිකාරීන් ඇත.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

18) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ,

A. විධායකය ව්‍යවස්ථාදායකයෙන් පරිබාහිරව තෝරා ගනී.

B. සාමූහික විධායකයක් පවතී.

C. ආණ්ඩුවේ නායකත්වය අගමැතිවරයා දරයි.

D. විධායකය ව්‍යවස්ථාදායකයෙන් උත්පාදනයවේ.

E. විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

19) ජනාධිපති ආණ්ඩුක්‍රමය ,

A. විධායක බලය ක්‍රියාවට නැංවීම සඳහා එක් පුද්ගලයෙකුට පැවරුන ආණ්ඩු ක්‍රමයකි.

B. ව්‍යවස්ථාදායකයේ කැමැත්ත මත තෝරාගනී.

C. ව්‍යවස්ථාව මගින් සංවරණය නොවූකල ඒකාධිපතියෙකු වීමේ ඉඩකඩ ඇත.

D. කැබිනට් ආණ්ඩු ක්‍රමයට වඩා කාර්යක්ෂම යැයි කියනු ලැබේ.

E. ව්‍යවස්ථාදායකයේ පාලනයෙන් මිදුන ස්වාධීන ආයතනයක් ලෙස සැලකේ.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

Education NCP - www.edncp.lk

20) බලපෑම් කණ්ඩායම් ,

A. ආණ්ඩුවේ ක්‍රියාමාර්ග වලට බලපෑම් කරයි.
B. ඕනෑම දේශපාලන ක්‍රමයක පිළිගනී.
C. අරමුණු ඉටුවීමෙන් පසු විසිරයා හැකි ය.
D. ආශා කණ්ඩායම් ලෙසද හැඳින්විය හැකි ය.
E. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රමයකි.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

21) දේශපාලන සමාජානුයෝජනය ,

A. මිනිසුන් දේශපාලනිකව අතරමංකරයි.
B. දේශපාලන ක්‍රමයේ ස්ථායීතාවයට හේතුවේ.
C. දේශපාලන ක්‍රමයට අනුගතකරයි.
D. මිනිසුන් දේශපාලන වශයෙන් දැනුවත් කරයි.
E. මින්සුන්ගේ දේශපාලන ආකල්ප හැඩගසයි.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

22) දේශපාලන සංස්කෘතිය ,

A. යම් දේශපාලන ක්‍රමයක විශ්වාසයන් ය.
B. යම් දේශපාලන ක්‍රමයක ගතිගුණයන් ය.
C. ආණ්ඩුව , පවුල සහ වෙළඳපළෙන් මිදුනක් ය.
D. ආණ්ඩුව කුමක් කරන්නේදැයි විනිශ්චය කිරීමට හැකි වූවක් ය.
E. දේශපාලන සංකේත කෙරෙහි ඇති බැඳීමක් ය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

23) අයිතිවාසිකම් ,

A. ගෞරවාන්විතව ජීවත්වීමට ලැබෙන හිමිකමකි.
B. පිරිපුන් ජීවිත ගතකිරීමට ලැබෙන සමාජ හිමිකම් ය.
C. අයිතිවාසිකම් උදෙසා විප්ලවකර ඇත.
D. අයිතිවාසිකම් අසහාය වේ.
E. වර්ග කිරීමේ හැකියාව ඇත.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

Education NCP - www.edncp.lk

24) නීතිය ,

A. සිරිත් විරිත් මගින් පෝෂණය වී ඇත.
B. සමාජයේ පොදු යහපත අරමුණු කොටගනී.
C. අධිකාරී බලය පදනම් කොට ගනී.
D. නීතිය හා සදාචාරය අතර පරස්පරතා ඇත.
E. මිනිසාගේ අභ්‍යන්තරය පාලනය කරයි.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

25) යහපාලනය ,

A. තුන්වන ලෝකයේ රටවල් කේන්ද්‍රකරගෙන මතු වූවකි.
B. එක්සත් ජාතීන් මේ පිළිබඳව උනන්දු වී ඇත.
C. 21 වන සියවසෙන් පසු ඇතිවූ කථිකාවතකි.
D. ආර්ථික අසංවර්ධනය නිසා කරලියට ආ මාතෘකාවකි.
E. සහභාගිත්ව භාවය මූලික අංගයකි.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

- **ප්‍රශ්න අංක 26 සිට 35 දක්වා ඒ ඒ ප්‍රශ්නයට අදාල ප්‍රකාශය පහෙන් හතරක් නිවැරදි ය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

26) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍යය යටත් විජිත පාලනයෙන් ,

A. ගම පදනම් කරගත්සමාජ සබඳතා වර්ධනය විය.
B. ධනවාදයේ වර්ධනයට පදනම වැටුණි.
C. වැඩවසම් ක්‍රමය අහෝසි කළේ ය.
D. වාණිජ වතුවගාව ආරම්භ කළේ ය.
E. නිදහස් ශ්‍රම වෙළඳපළක් බිහිවි ය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

27) 1833 - 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය දක්වා ශ්‍රී ලංකාව තුළ ,

A. ලාංකිකයන්ට විධායක පුහුණුවක් ලැබුණි.
B. වෘත්තීය නිලබල තන්ත්‍රයක් බිහිවිය.
C. ඒකීය අධිකරණ පද්ධතියක් බිහිවිය.
D. වගකීමේ ආණ්ඩුක්‍රමයට පදනම වැටුණි.
E. වාර්ගික නියෝජනය මුලුමනින්ම අහෝසි කරන ලදී.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

Education NCP - www.edncp.lk

28) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණය මගින් ,

A. ඒකාබද්ධ පාලනක්‍රමයක් ඇති කළේ ය.
B. රජයේ වෙළඳ ඒකාධිකාරය ඇති කළේ ය.
C. රජයේ සේවකයන්ගේ වැටුප් සීමා කළේ ය.
D. ව්‍යවස්ථාදායක හා විධායක සභාවක් ඇති කළේ ය.
E. රාජකාරීක්‍රමය අහෝසි කළේ ය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

29) කෝල්බෲක් කොමිසමේ නිර්දේශ වූයේ ,

A. දිවයිනට විදේශීය ආයෝජන ගෙන්වා ගැනීමට පියවර ගැනීම.
B. යටත් විජිත පාලනයේ නිළධාරීන් වාණිජ කටයුතු වලට සහභාගිවීම තහනම් කිරීම.
C. ආණ්ඩුකාරවරයා රට පාලනය කරන විධායකයෙකු බවට පත් කිරීම.
D. දිවයින පාරිපාලන ඒකක 15 (පහළොවකට) බෙදීම.
E. කොළඹින් පිටත ඉඩම් මිලදී ගැනීමට , යුරෝපීයන්ට තිබූ තහංචි ඉවත් කිරීම.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

30) ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය ,

A. සර්ව ආගමික පුනර්ජීවන ව්‍යාපාරය මෙහි ආරම්භක කණ්ඩායම විය.
B. අමද්‍යප ව්‍යාපාරයට පදනම සැපයී ය.
C. මධ්‍යම පාංතික ව්‍යාපාරයක් විය.
D. ලංකා ප්‍රතිසංස්කරණ සංගමයට අවශ්‍ය පදනම සැපයී ය.
E. මධ්‍යස්ථ මතවාදීන් හා ගතානුගතිකවාදීන් මූලිකත්වය ගත්තේ ය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

31) ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය නිරූපණය කළේ ,

A. ප්‍රභූ පංතියේ ව්‍යාපාරයක් ලෙස ය.
B. මධ්‍යම පංතියේ අරමුණු ඉටුකිරීමක් ලෙස ය.
C. පූර්ණ නිදහස දිනාගැනීමේ ව්‍යාපාරයක් ලෙස ය.
D. ප්‍රතිසංස්කරණවාදී ව්‍යාපාරයක් ලෙස ය.
E. ව්‍යවස්ථානුකූල හා සම්මුතිකාමී ව්‍යාපාරයක් ලෙස ය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

Education NCP - www.ednocp.lk

32) 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය යටතේ ,

A. ව්‍යවස්ථාදායක සභාවේ සමාජික සංඛ්‍යාව 49 ක් විය.
B. නිලලත් අයට වඩා නිල නොලත් පිරිස වැඩිවි ය.
C. ව්‍යවස්ථාදායකයට මූල්‍ය නීති පැනවීමේ බලය හිමි නොවී ය.
D. විධායක මණ්ඩලය අණ්ඩුකාරවරයාගේ උපදේශය මණ්ඩලයක් ලෙස කටයුතු කළේ ය.
E. නිලලත් නියෝජිතයන්ගෙන් එක් අයෙකු ව්‍යවස්ථාදායක සභාවේ සභාපති විය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

33) ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය ,

A. 1930 ගණන්වල පැවති ලෝක ආර්ථික අර්බුදය එහි වර්ධනයට හේතු විය.
B. කම්කරු ව්‍යාපාරයේම පැතිකඩකි.
C. අවශ්‍ය පිරිස් බලය ග්‍රාමීය මට්ටමින් සහාය ලබා දුන්නේ ය.
D. සමාජවාදී සමාජක්‍රමයක් ගොඩනැගීම අරමුණු විය.
E. 1974 ඇති වූ මැලේරියා වසංගතය නිසා ජනප්‍රිය විය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

34) ඩොනමෝර් අණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට බලපෑ හේතු වූයේ ,

A. ව්‍යවස්ථාදායක හා විධායක සභා දුර්වල වීම.
B. සීමිත ඡන්ද බලය පුලුල් නොවීම.
C. බ්‍රිතාන්‍ය යටත්විජිත ප්‍රතිපත්තියේ වූ වෙනස්කම්.
D. කම්කරු නායකයන්ගේ ඉල්ලීම.
E. විධායක කාරක සභා දුර්වල වීම.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

35) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරවරයා ,

A. සිවිල් සේවය පාලනය කළේ ය.
B. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිත්‍ය සමාජිකයෙක් විය.
C. හමුදාවන්හි ප්‍රධාන අණදෙන්නා විය.
D. විධායක කටයුතු මෙහෙයවීමේ පූර්ණ බලතල හිමිවිය.
E. විශේෂ තත්වයන් යටතේ නීති පැනවීමේ බලය හිමිවිය.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 36 සිට 50 දක්වා සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

36) 1931 සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම තුළින් ,

1) මැතිවරණ ක්‍රියාදාමය තුළින් පාලකයන් තීරණය විය.
2) පාලකයා ජනතාවට වගකීමට පුරුදුවීම ආරම්භ විය.
3) සමාජ සුබසාධන කටයුතු වර්ධනය විය.
4) පීඩිත ජන කොටස් තවත් පීඩනයට පත් විය.
5) ප්‍රජා සෞඛ්‍ය සේවාවන් ව්‍යාප්ත විය.

37) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් ,

1) ඩොමීනියන් තත්වයේ නිදහසක් පිරිනමන ලදී.
2) වෙස්ට්මින්ස්ටර් ආකෘතියේ ආණ්ඩුක්‍රමයක් පිරිනමන ලදී.
3) බ්‍රිතාන්‍ය ආධිපත්‍ය තවදුරටත් බලපවත්වන ලදී.
4) නාමික විධායකයක් හඳුන්වාදෙන ලදී.
5) පාර්ලිමේන්තුව පූර්ණ ව්‍යවස්ථාදායක බලය භුක්තිවිඳින ලදී.

38) 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය ,

1) සාමූහික වගකීමේ චාරිත්‍රයට බැඳී සිටියේ ය.
2) දෝෂාභියෝග යෝජනාවකින් ඉවත්කළ හැක.
3) අගමැතිගේ නායකත්වයෙන් කටයුතු කරයි.
4) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය ලෙස හඳුන්වයි.
5) ව්‍යවස්ථාදායකයෙන් උත්පන්න වේ.

39) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ නවාංග වනුයේ ,

1) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම.
2) දෙවන මණ්ඩලයක් පිහිටුවීම.
3) ආණ්ඩුකාරධූරයක් ඇති කිරීම.
4) සුභ ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධිවිධාන ඇති කළේ ය.
5) අධිකරණ සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම.

40) ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙරටට හඳුන්වාදුන් ප්‍රතිපාදන වූයේ ,

1) විධායක ජනාධිපති ධූරය හඳුන්වාදීම.
2) ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම.
3) අධිකරණ සේවා උපදේශක මණ්ඩලයක් පිහිටුවීම.
4) මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාගත කිරීම.
5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම.

41) ජාතික රාජ්‍ය සභාව ,

1) ව්‍යවස්ථාවෙන් නිර්මාණය කළ බලවත් දේශපාලන ආයතනය විය.
2) ත්‍රිවිධ බලය ඒකරාශී වූ ආයතනය විය.
3) පනවන කිසිදු නීතියක් අධිකරණයක ප්‍රශ්න කළ නොහැකිවීම.
4) නිල කාලය වසර 4 ක් වීම.
5) පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මූලධර්ම මත ගොඩනගා තිබුණි.



Education NCP - www.edncp.lk

42) ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා ,

1) පත්කිරීමේ බලය අගමැතිවරයා සතුවිය.
2) ඡන්ද බලය හිමි ඕනෑම ශ්‍රී ලාංකිකයෙකු පත්කළ හැකි ය.
3) නිල කාලය වසර 06 කි.
4) අමාත්‍ය මණ්ඩලය පත්කිරීමේ බලය භුක්තිවිඳී.
5) ජාතික රාජ්‍ය සභාවේ $\frac{2}{3}$ ක බහුතරයෙන් ඉවත්කළ හැක ය.

43) ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවය ,

1) උපදේශක මණ්ඩලය හා විනය මණ්ඩලය ලෙස කොටස් දෙකකින් යුක්ත විය.
2) පාලනය පිළිබඳ බලතල අමාත්‍ය මණ්ඩලය යටතට ගන්නා ලදී.
3) සිය කටයුතු සම්බන්ධයෙන් , ජාතික රාජ්‍ය සභාවට වගකියන ලදී.
4) සිය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට වගකීමට බැඳී සිටී.
5) උපදේශක මණ්ඩලයට හා විනය මණ්ඩලයට ලේකම්වරු පත්කරන්නේ කතානායක විසිනි.

44) 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නවාංග වනුයේ ,

1) සමානුපාතික නියෝජන ක්‍රමය
2) ජනමත විචාරණය
3) ඩම්බුඩිස්මන්ධූරය
4) විධායක ජනාධිපතිධූරය
5) ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය

45) 1978 ජනාධිපතිධූරය ,

1) අධිකරණ නිර්මුක්තිය සහිතවේ.
2) නිල කාලය පිළිබඳ ඒකමතික බවක් නැත.
3) පාර්ලිමේන්තුවට වග නොකියයි.
4) ශ්‍රී ලංකාව එක් ඡන්දකොට්ඨාසයක් ලෙස ගෙන ජනතා ඡන්දයෙන් පත්කරයි.
5) කැබිනට් මණ්ඩලය පත්කිරීමේ කාර්ය හිමිවේ.

46) 1978 පාර්ලිමේන්තුව ,

1) නීති සම්පාදනයේදී පරමාධිපති බලය භුක්තිවිඳි ආයතනයක් නොවී ය.
2) ජනමත විචාරණය පැවැත්වීමේ බලය හිමිවි ය.
3) රාජ්‍ය මූල්‍ය පාලන බලයේ තනි හිමිකරු ය.
4) ඡන්දයෙන් සහ නාමකරණයෙන් පත්කළ මන්ත්‍රීවරුන්ගෙන් යුක්ත ය.
5) පනත් කෙටුම්පත් අනුමතවීමට කථානායක අනුමත කළ යුතු ය.

47) 1978 පාර්ලිමේන්තුව ,

1) මංගල සභාවාර කැඳවීමේ බලය ජනාධිපති සතු ය.
2) වසරකට වරක්වත් රැස්විය යුතු ය.
3) විධියක බලය සංවරණ කිරීමේ බලයෙන් යුක්ත ය.
4) ආණ්ඩුපක්ෂය, විපක්ෂය ලෙස මණ්ඩල දෙකකින් යුක්ත ය.
5) සාමාජිකයින් 225 කින් යුක්ත ය.

48) 1978 අධිකරණය ,

1) ඉහළ හා පහළ ලෙස අධිකරණය පද්ධති දෙකකින් යුක්ත වේ.
2) ඉහළම අභියාචනාධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි.
3) විනිසුරුවන් පත්කිරීමේ බලය නීතිපති සතු ය.
4) විනිසුරුවන් දෙන ලද තීන්දුවකට පෞද්ගලිකව නඩු පැවරිය නොහැකි ය.
5) විනිසුරු වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වේ.

49) 1978 නියෝජන ක්‍රමය ,

1) සරලබහුතර හා සමානුපාතික යන ක්‍රම දෙකෙන් යුක්ත ය.
2) බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස මගින් ක්‍රියාත්මක වේ.
3) මන්ත්‍රීධුරයක් සඳහා සම්ප්‍රයුක්ත ඡන්ද සංඛ්‍යාව පදනමක් ලෙස යොදා ගනී.
4) ජනතාව ඡන්දය දිය යුත්තේ පක්ෂය ඉදිරිපත් කරන ලැයිස්තුවකටයි.
5) එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර ගැටුම් ඇති කිරීමේ ප්‍රවණතාවයක් ඇත.

50) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ,

1) ප්‍රධාන පක්ෂ දෙකක් වටා ඒකරාශී වී ඇත.
2) දීර්ඝ කාලීන ඉතිහාසයකින් යුක්ත වේ.
3) සෑම විටම සභාග ආණ්ඩු බිහිවීමේ ප්‍රවණතාවක් ඇත.
4) 70 දශකයෙන් පසු වමාංශික පක්ෂ ප්‍රධාන පක්ෂ වටා ඒකරාශී වී ඇත.
5) පවතින මැතිවරණ ක්‍රමය නිසා බහු පක්ෂ ක්‍රමයක් දක්වා වර්ධනය වී තිබේ.

***

Education NCP - www.edncp.lk